# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1441 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 18/11/2023<br>පැය 0840 |

## මාධ්‍ය නිවේදනය

**සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීමට යාමේදී පොලිස් නිලධාරින්ට පහර දීමක් - කොම්පඤ්ඤවීදිය පොලිස් වසම.**

2023.11.16 වන දින රාත්‍රී කාලයේදී කොළඹ දකුණ කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මත් ද්‍රව්‍ය ජාවාරම් වලට සම්බන්ධ සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඔහුගෙන් අනාවරණය වු තොරතුරු මත එම සැකකරුට මත්ද්‍රව්‍ය ලබා දුන් ජාවාරම්කරුවන් දෙදෙනෙකු උපක්‍රමශීලීව අත්අඩංගුවට ගැනීමට යාමේදී ඔවුන් පැමිණෙමින් සිටි යතුරු පැදියෙන් පලා ගොස් ඇති අතර නිලධාරින් විසින් ඔවුන් පසු පස හඹා යාමේදී එම සැකකරුවන් කොම්පඤ්ඤවීදිය පොලිස් වසමේ ස්ටුවට් වීදිය 57 වත්තේ නිවසකට ඇතුළු වී ඇත.

නිලධාරීන් විසින් එම සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට සූදානම් වූ අවස්ථාවේදී එම ස්ථානයේ සිටි පිරිසක් විසින් නිලධාරීන්ගේ ශරීරයට පෙට්‍රල් විසිකරමින් ගිනි තැබීමට උත්සහ කර අතින් පයින් පහරදී රාජකාරියට බාධා කර ඇත. එම අවස්ථාවේ නිලධාරීන් විසින් හඹා පැමිණි සැකකරුවන් දෙදෙනාට අත්විලංගු යොදා ඇති අතර, අදාල පිරිස විසින් කලහකාරි ලෙස හැසිරෙමින් නිලධාරීන්ට පහර දෙන අවස්ථාවේ සැකකරුවන් දෙදෙනා අත් විලංගු ද සමඟ අත්අඩංගුවෙන් මිදී පලාගොස් ඇත. එම ස්ථානයේ සිටි පිරිස දිගින් දිගටම කලහකාරී ලෙස හැසිරෙමින් නිලධාරීන්ට පරුෂ වචනයෙන් බැන වදිමින් මන්නා පිහි ඇතුළු ආයුධ වලින් පහරදීමට සැරසුණු අවස්ථාවේදී ආරක්ෂාව පිණිස තත්ත්වය පාලනය කිරීමට නිලධාරීන් අහසට වෙඩි තැබීමක් සිදුකර ඇත.

අනතුරුව මෙම සිදුවීම සම්බන්ධයෙන් කොම්පඤ්ඤවීදිය පොලිස් ස්ථානය දැනුවත් කිරීමට කටයුතු කර ඇති අතර, රාජකාරියට බාධා කරමින් මෙසේ ප්‍රචණ්ඩකාරීව හැසිරුණු සැකකරුවන් 06 දෙනෙකු සහ සැකකාරියන් 03 දෙනෙකු, පලාගිය සැකකරුවන් පැමිණි යතුරු පැදිය හා පෙට්‍රල් ගැසීම සඳහා යොදා ගත් බෝතල් 02ක්ද සමඟ කොම්පඤ්ඤවීදිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් 24 ත් 44 අතර වයස් වල පසුවන හා සැකකාරියන් අවුරුදු 30, 54 හා 60 වයස්වල පසුවන කොම්පඤ්ඤවීදිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් පහරදීමෙන් තුවාල ලැබූ පොලිස් නිලධාරියකු ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කර ඇත. අත්අඩංගුවට ගත් සැකකරුවන් හා සැකකාරියන්

2023.11.17 වන දින කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව හඳුනා ගැනීමේ පෙරට්ටුවට ඉදිරිපත් කිරිම සඳහා 2023.11.28 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. පලායන ලද සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා කොළඹ දකුණ කොට්ඨාස අපරාධ විමර්ශන අංශය සහ කොම්පඤ්ඤවීදිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**